# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,163 - 2020 පෙබරවාරි මස 14 වැනි සිකුරාදා - 2020.02.14**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : I වැනි ඡේදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | 182 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |
| රජයේ නිවේදන ... ... ... | 182 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | 183 |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 188 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


***සැ. යු.*** - (i) මුදල් (සංශෝධන) පනත් කෙටුම්පත 2020 පෙබරවාරි මස 07 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත 2020 පෙබරවාරි මස 07 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2020 මාර්තු මස 6 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2020 පෙබරවාරි මස 20 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

2020 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## වෙනත් පත්කිරීම් ආදිය

2020 අංක 69

**ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය**

2002 අංක 17 දරන මැනුම් පනත

**27 වැනි වගන්තිය යටතේ ඉඩම් මැනුම් සභාවේ සාමාජිකයින් පත් කිරීම**

2002 අංක 17 දරන මැනුම් පනතේ 27 (අ) වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා වශයෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව ඉඩම් මැනුම් සභාවේ සාමාජිකයින් පත් කරමින් 2019.04.26 දිනැති අංක 2,121 දරන ගැසට් පත්‍රයේ පළකරන ලද නිවේදනය පහත සඳහන් ලෙස 2020.02.01 දින සිට බලපැවැත්වෙන පරිදි සංශෝධනය කරමි.

(අ) නිල බලයෙන් සාමාජිකයින් වන තැනැත්තන් -

I. අඹවල ලියනගේ ශ්‍යාමලී චිත්‍රලේඛා පෙරේරා - අතිරේක සර්වේයර් ජනරාල් - උප සභාපති - 2020.02.01 දින සිට අතිරේක සර්වේයර් ජනරාල් ධුරයේ රැඳී සිටින කාලය දක්වා.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය.

වර්ෂ 2020 ක්වූ ජනවාරි මස 29 වැනි දින,
කොළඹ දී ය.

02-285

---

## රජයේ නිවේදන

**ප්‍රාදේශීය මහා ලේකම් කාර්යාලය - හොරණ**

ඕලබොඩුව ඓතිහාසික උපුල්වන් ශ්‍රී විෂ්ණු මහා දේවාල පෙරහැර - 2020

362 අධිකාරිය වූ වන්දනා ගමන් ආඥා පනත යටතේ පළකර ඇති අංක 2064/29, 2018.03.28 වැනි දිනැති ගැසට් පත්‍රය ප්‍රකාරව හා 1992 අංක 58 දරන බලතල පැවරීම (ප්‍රාදේශීය ලේකම්වරුන්) පනත අනුව හොරණ ප්‍රාදේශීය ලේකම් අයිරංගනී වීරසිංහ වන මා වෙත පැවරී ඇති බලතල අනුව 2020 ඕලබොඩුව රජ මහා විහාරස්ථ ඓතිහාසික උපුල්වන් ශ්‍රී විෂ්ණු මහා දේවාල පෙරහැර සම්බන්ධයෙන් පහත නියෝග පවරමි.

1. මෙවර ඕලබොඩුව රජ මහා විහාරස්ථ ඓතිහාසික උපුල්වන් ශ්‍රී විෂ්ණු මහා දේවාල පෙරහැර 2020 ජනවාරි මස 25 වැනි දිනෙන් ආරම්භ වී පෙබරවාරි මස 02 වැනි දිනෙන් අවසන් වන බව දැනුම් දෙමි.

2. උතුරට නවම් මාවත හා අලි ඇතුන් ගාල් පිටිය ද, දකුණට නිශ්ශංකමල්ල රජ මාවත ද, නැගෙනහිරට නිශ්ශංකමල්ල රජ මාවත ද, සහ ළිං පොකුණු ද, බස්නාහිරට 120/127 ප්‍රධාන මාර්ගය හා එතැනින් එපිට දේවාල ද, යන සීමාවන්ට මැදිව පිහිටි භූමි භාගය ශ්‍රී විශ්ණු මහා දේවාල උත්සවය පවත්වන භූමි භාගය වේ.

3. ඕලබොඩුව රජ මහා විහාරස්ථ පූජා භූමියේ සිට නිශ්ශංකමල්ල රජ මාවත ඔස්සේ 127 ප්‍රධාන මාර්ගය (මොරගහහේන ගෝනපොල) ට පිවිස ගෝනපොල දෙසට ගමන් කිරීම ද ඕලබොඩුව හන්දියෙන් දකුණට හැරී තලගල පාරේ පේරගස් හන්දිය දක්වා පෙරහැර හන්දිය දක්වා ගමන් කොට දකුණට හැරී ශ්‍රී ධර්මරතන මාවතේ මීටර් 500ක් ගමන් කොට දකුණට හැරී නවම් පෙරහැර මාවතේ 127 ප්‍රධාන මාර්ගයට පිවිස එම මාර්ගයේ වමට (මොරගහහේන දෙසට) හැරී නැවතත් රජ මහා විහාර ප්‍රධාන දොරටුවෙන් විහාරස්ථානයට ගෙවදීම පෙරහැර ගමන් මාර්ගය වේ.

4. බස්නාහිරට වෙල අද්දර අඩි 70x2 නැරඹුම් කුටි 3ක් වේ.

5. දේවාල භූමිය හා ඒ අවට භූමිය තුළ ආහාර පිසීම තහනම් කරමි.

6. පෙරහැර දින 05 තුළ දේවාල භූමිය තුළ වෙළඳාම් කිරීම තහනම් කරමි.

7. රථගාල් පරිශ්‍රය තුළ හැර උත්සව භූමිය ඇතුළත අන් කිසිදු ස්ථානයක පුද්ගලික වාහන නතර කිරීම තහනම් කරමි. බයිසිකල් හා කරත්ත ඇතුළුව සියලුම රථ වාහන මඟින් හෝ කඳවුරු භාර නිලධාරීතැනගේ අවසර පත්‍රයක් නොමැතිව උත්සව භූමියට ඇතුළු කිරීම තහනම් කරමි.

8. හොරණ ප්‍රාදේශීය ලේකම් මඟින් ලබාගත් අවසර පත්‍රයක් නොමැතිව කඳවුරු ප්‍රදේශයේ කිසිම ගොඩනැගිල්ලක් ඉදිකිරීම තහනම් කරමි.

**15 වන ව්‍යවස්ථාව**

(අ) කිසිවකු විසින් ප්‍රාදේශීය ලේකම්තැනගේ අවසර ලබා ගෙන මිස වීදියක් වශයෙන් පාවිච්චි කරන්නා වූ හෝ වෙන් කර ගන්නා වූ උත්සව භූමිය තුළ වෙනයම් භූමි කොටසක් හෝ ඇසුරු කරගෙන මඩුවක් හෝ කිසි අන්දමක ගොඩනැගිල්ලක් ඉදි කිරීම හෝ විශාල කිරීම නොකළ යුතු ය.

(ආ) ප්‍රාදේශීය ලේකම්තැනගේ හෝ බලයලත් නිලධාරීන්ගේ අනුමැතිය නොමැතිව කිසියම් තැනැත්තෙකු විසින් උත්සව භූමිය තුළ ටිකට්පත් කොඩි විකිණීම හෝ වෙනත් අන්දමක කුමන කාර්යක් සඳහා හෝ දායක මුදල් එකතු කිරීම නොකළ යුතු ය.

(ඇ) ඔලබොඩුව ඓතිහාසික උපුල්වන් ශ්‍රී විෂ්ණු මහා දේවාල පෙරහැර පවත්වන කාල සීමාව තුළ එම භූමියේ සහ ඒ අවට දේවාලය සීමාව තුළ දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන හා සියලුම මත්ද්‍රව්‍ය විකිණීම හා භාවිතා කිරීම සම්පූර්ණයෙන් තහනම් කරමි.

අයිරංගනී වීරසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
හොරණ.

02-341

---

# ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා

**ශ්‍රී ලංකා නැගෙනහිර විශ්ව විද්‍යාලය**
2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
**මූල්‍ය ක්‍රියාකාරිත්වය පිළිබඳ ප්‍රකාශය (ඒකාබද්ධ)**

| | 2018 | 2017 |
|---|---|---|
| **මෙහෙයුම් ආදායම** | රු. | රු. |
| පුනරාවර්තන ප්‍රතිපාදන | 1,477,100,000 | 1,193,688,000 |
| වෙනත් ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ ආදායම්/වියදම් | 1,070,359 | 1,013,263 |
| වෙනත් ආදායම් | 20,860,194 | 44,209,662 |
| මුළු මෙහෙයුම් ආදායම | 1,499,030,553 | 1,238,910,925 |
| සිසුන් සඳහා මූල්‍යාධාර | 187,037,900 | 92,233,400 |
| | **1,686,068,453** | **1,331,144,325** |

| | 2018<br>රු. | 2017<br>රු. |
|---|---|---|
| **මෙහෙයුම් වියදම්** | | |
| වැටුප් හා වේතන | 1,107,373,273 | 899,303,660 |
| ගමන් වියදම් | 4,473,476 | 4,160,717 |
| සැපයුම් හා පාරිභෝගික භාවිත | 43,369,666 | 45,693,665 |
| සුළු නඩත්තු සේවා | 26,834,397 | 25,262,342 |
| කොන්ත්‍රාත්තු සේවා | 221,955,061 | 234,397,626 |
| පර්යේෂණ හා සංවර්ධන වියදම් | 471,567 | 1,124,784 |
| ක්ෂය හා ක්‍රමක්ෂය වියදම් | 375,764,645 | 313,865,444 |
| වෙනත් මෙහෙයුම් වියදම් | 64,352,310 | 49,917,967 |
| **මුළු මෙහෙයුම් වියදම්** | **1,844,594,395** | **1,573,726,204** |
| **මෙහෙයුම් කටයුතුවලින් ලද අතිරික්තය/ඌනතාව** | (345,563,842) | (334,815,279) |
| සිසුන් සඳහා මූල්‍යාධාර | 187,037,900 | 92,233,400 |
| මුළු කටයුතුවලින් ලද අතිරික්තය/ඌනතාව | **(345,563,842)** | **(334,815,279)** |
| අතිවිශේෂ අයිතම | **-** | **-** |
| (ලියා හැරීම හා වෙනත් ගැලපුම්) | (27,968) | (231,947) |
| **පොදු සංචිතයට මාරු කරන ලද කාලච්ඡේදය සඳහා වූ ශුද්ධ අතිරික්තය/(ඌනතාව)** | **(345,591,810)** | **(335,047,226)** |

**ශ්‍රී ලංකා නැගෙනහිර විශ්ව විද්‍යාලය**
2018 දෙසැම්බර් 31 දිනට
**මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය (ඒකාබද්ධ)**

| | *2018*<br>*රු.* | | *2017*<br>*රු.* | |
|---|---|---|---|---|
| **වත්කම්** | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | |
| දේපළ පිරියත හා උපකරණ | 4,573,504,638 | | 4,290,663,417 | |
| අස්පෘශ වත්කම් | 43,645,531 | | 41,404,286 | |
| අයෝජන (දිගුකාලීන) | 7,451,355 | | 6,894,067 | |
| ප්‍රාග්ධන නොනිමි වැඩ | 524,761,553 | | 471,144,490 | |
| | | 5,149,363,077 | | 4,810,106,260 |
| **ජංගම වත්කම්** | | | | |
| තොගය | 9,661,200 | | 11,163,371 | |
| වෙළෙඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ | 631,106,584 | | 636,998,692 | |
| ආයෝජන (කෙටිකාලීන) | 84,563,384 | | 77,846,265 | |
| මුදල් හා මුදල් සමාන දෑ | 364,139,196 | | 202,013,187 | |
| | | 1,089,470,364 | | 928,021,514 |
| **මුළු වත්කම්** | | 6,238,833,441 | | 5,738,127,774 |
| **වගකීම්** | | | | |
| **ජංගම වගකීම්** | | | | |
| ගෙවිය යුතු දෑ | 254,248,051 | | 286,616,358 | |
| උපචිත වියදම් | 40,214,472 | | 50,227,388 | |
| කල්බදු වගකීම් (කෙටි කාලීන) | 5,107,034 | 299,569,557 | 4,604,282 | 341,448,029 |

| | | 2018 | | 2017 |
|---|---|---|---|---|
| | | රු. | | රු. |
| **ජංගම නොවන වගකීම්** | | | | |
| ගෙවිය යුතු දෑ | 6,799,397 | | 5,612,573 | |
| කල්බදු වගකීම් (දිගු කාලීන) | 12,209,160 | | 17,286,143 | |
| පාරිතෝෂික සඳහා වෙන්කිරීම් | 215,973,769 | | 170,809,693 | |
| සීමිත අරමුදල් | 91,765,658 | | 76,717,649 | |
| ත්‍යාග හා ප්‍රදාන | 6,342,684 | | 8,888,765 | |
| අනෙකුත් ප්‍රතිපාදන | 884,691,301 | | 756,285,640 | |
| | | 1,217,781,969 | | 1,035,600,462 |
| **මුළු වගකීම්** | | 1,517,351,526 | | 1,377,048,490 |
| | | | | |
| සමුච්චිත අරමුදල (ප්‍රාග්ධන ප්‍රතිපාදන) | 6,388,598,617 | | 5,692,915,886 | |
| ඇප බැඳුම්කර සංචිත | 184,705,820 | | 188,269,504 | |
| පොදු සංචිත | (1,953,331,229) | | (1,606,717,226) | |
| ප්‍රාග්ධන සංචිත | 101,508,707 | | 86,611,119 | |
| **මුළු ශුද්ධ වත්කම්/හිමිකම** | | 4,721,481,915 | | 4,361,079,284 |
| **මුළු වගකීම්/හිමිකම්** | | **6,238,833,441** | | **5,738,127,774** |
| **(මුළු යෙදවූ අරමුදල්)** | | | | |

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතන විසින් නිකුත් කර ඇති ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 106 (i) හා 107 (ii) b කොටස් අනුව හා 1971 අංක 38 දරන මුල්‍ය පනතේ 13(6) කොටස්වලට අනුකූලව, මෙම මුල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඉදිරිපත් කරනු ලැබ ඇත.

මහාචාර්ය එෆ්. සී. රාගල්,
ගණන්දීමේ නිලධාරී,
උප කුලපති.

ඒ. බහිරදන්,
සහකාර ගණන්දීමේ නිලධාරී,
ලේඛකාධිකාරී.

එම්. එම්. එම්. ෆාරීස්,
මූල්‍යාධිකාරී.

## ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

**ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| | *2018* | *2017* |
|---|---|---|
| | *රු.* | *රු.* |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහ** | | |
| සාමාන්‍ය ක්‍රියාකාරකම්වලින් ලද අතිරික්තය/ඌනතාව | (345,591,810) | (335,047,226) |
| | | |
| **මුදල් නොවන ප්‍රවාහ** | | |
| ක්ෂය | 381,815,116 | 331,617,567 |
| ක්‍රමක්ෂය | (55,868,384) | (53,557,584) |
| පෙර වර්ෂයේ ගැලපීම් | 48,167 | (631,544) |
| වත්කම් ඉවත්කිරීමෙන් ලද ලාභ | (423,356) | - |
| පාරිතෝෂික සඳහා වෙන්කිරීම | 49,817,914 | 35,805,460 |
| කල්බදු වාහන සඳහා වූ මුල්‍ය පිරිවැය | 3,137,761 | 2,548,695 |

| | 2018<br>රු. | 2017<br>රු. |
|---|---|---|
| පොළී ආදායම | (1,804,017) | (6,691,193) |
| තොග වැඩිවීම/අඩුවීම | 1,502,168 | 1,872,901 |
| වෙළෙඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ වැඩිවීම/අඩුවීම | 5,892,107 | 19,911,013 |
| ගෙවිය යුතු දෑ වැඩිවීම/අඩුවීම | (31,865,553) | (18,530,485) |
| උපචිත වියදම් වැඩිවීම/අඩුවීම | (10,012,916) | 19,915,710 |
| පාරිතෝෂික ගෙවීම් | (4,653,837) | (4,176,836) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(8,006,640)** | **(6,963,522)** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහය** | | |
| දේපළ පිරියත හා උපකරණ මිළ දී ගැනුම් | (668,923,550) | (2,592,163,575) |
| කෙරීගෙන යන වැඩ | (53,617,063) | 1264,058,968 |
| අස්පෘශ වත්කම් | (12,645,867) | (18,617,757) |
| ලද පොළී | 1,804,017 | 6,691,193 |
| ආයෝජන | (7,274,407) | (21,427,294) |
| වත්කම් ඉවත්කිරීමෙන් ලද විකුණුම් ආදායම | 423,356 | - |
| **අයෝජන ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(740,233,514)** | **(1,361,458,465)** |
| **මුල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහය** | | |
| සීමිත අරමුදල් හා බාහිර ප්‍රාග්ධන ප්‍රතිපාදන | 224,744,083 | 487,296,233 |
| ප්‍රාග්ධන වියදම් සඳහා රාජ්‍ය ප්‍රතිපාදන | 692,650,000 | 613,450,000 |
| ශුද්ධ දිගු කාලීන බැඳීම් | (3,890,159) | 7,282,940 |
| කල්බදු වාහන සඳහා වූ මුල්‍ය පිරිවැය | (3,137,761) | (2,548,695) |
| **මුල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | **910,366,163** | **1,105,480,478** |
| **මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩිවීම/අඩුවීම** | **162,126,009** | **(262,941,509)** |
| **වර්ෂය ආරම්භයේ දී මුදල් හා මුදල් සමාන දෑ** | **202,013,187** | **464,954,696** |
| **වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ** | **364,139,196** | **202,013,187** |

## ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

**ශුද්ධ වත්කම්/හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය**

| | සමුච්චිත අරමුදල | ඇප බැඳුම්කර සංචිත | පොදු සංචිතය | වෙනත් සංචිත | එකතුව රු. |
|---|---|---|---|---|---|
| **2016 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 5,100,197,385 | 170,584,861 | (1,270,025,194) | 21,190,067 | 4,021,947,120 |
| වර්ෂයේ අතිරික්තය/ඌනතාවය | - | - | (335,047,226) | - | (335,047,226) |
| වෙනත් ගැලපුම් | - | - | (631,545) | - | (631,545) |
| අනෙකුත් සංචිතවල වැඩිවීම/අඩුවීම | - | 17,684,643 | (1,013,260) | 65,421,051 | 82,092,434 |
| අතිරේක දායකත්වය | 592,718,501 | - | - | - | 592,718,501 |
| **2017 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 5,692,915,886 | 188,269,504 | (1,606,717,226) | 86,611,119 | 4,361,079,284 |

| | සමුච්චිත අරමුදල | ඇප බැඳුම්කර සංචිත | පොදු සංචිතය | වෙනත් සංචිත | එකතුව රු. |
|---|---|---|---|---|---|
| වර්ෂයේ අතිරික්තය/ඌනතාවය | - | - | (345,591,810) | - | (345,591,810) |
| වෙනත් ගැලපුම් | - | - | 48,166 | - | 48,166 |
| අනෙකුත් සංචිතවල වැඩිවීම/අඩුවීම | - | (3,563,684) | (1,070,359) | 14,897,588 | 10,263,546 |
| අතිරේක දායකත්වය | 695,682,731 | - | - | - | 695,682,731 |
| **2018 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 6,388,598,617 | 184,705,820 | (1,953,331,229) | 101,508,707 | 4,721,481,915 |

ENP/BT/C/EUSL/01/2019/02 18 ජූලි 2019

උපකුලපති
ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය

**ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

1. **මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ ("විශ්වවිද්‍යාලය") 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය සහ හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 28 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේ දී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම 1.2 කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආයතනයේ 2018 දෙසැම්බර් 31 වැනි දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට/ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 අනුව, ඉඩම් සහ ගොඩනැගිලි එකට මිලදී ගත් අවස්ථාවලදී වුව ද ඒවා වෙන වෙනම ගිණුම්ගත කළ යුතු වේ. එසේ වුව ද 2018 දෙසැම්බර් 31 දිනට මෙම විශ්වවිද්‍යාලයේ ඉඩම් සහ ගොඩනැගිලිවල වටිනාකම වන රු. 2,712,073,167 වෙන වෙනම පෙන්වනවා වෙනුවට එක් අගයක් ලෙසින් පෙන්වා ඇත.

(ආ) ආයතනය විසින් අඛණ්ඩව ආදායමට වඩා වියදම වැඩිවීම් තත්ත්වයන් තුළින් හිඟයක් පවත්වා ගැනීමෙන් එහි ශුද්ධ වත්කම් ඛාදනය වීමක් සිදුවන අතර මහා භාණ්ඩාගාරය සහ රජයේ ප්‍රමාණවත් මූල්‍ය සහයෝගයක් නොමැතිව ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ සැකසහිත තත්ත්වයක් මතු වී ඇත. විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශනවල පොදු සංචිත ගිණුමේ සෘණ ශේෂයක් අඛණ්ඩව නිරීක්ෂණය වේ.

(ඇ) විශ්වවිද්‍යාලයට අයත් හෙක්ටයාර් 210.03න් සමන්විත ඉඩම් ඒකක 11ක් සහ ගොඩනැගිලි අගය කර මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොමැත.

(ඈ) සන්නිවේදන හා ව්‍යාපාර අධ්‍යයන පීඨයේ පස් මහල් ගොඩනැගිලි සංකීර්ණ ඉදිකිරීම සහ ත්‍රිකුණාමලය මණ්ඩපයේ ශ්‍රවණාගාරය සඳහා වූ දෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරීම වෙනුවෙන් ගෙවා ඇති රු. මිලියන 75ක වටිනාකම කෙරීගෙන යන වැඩ ගිණුමේ පෙන්වා නොමැත.

(ඉ) 2018 වර්ෂය සඳහා රුපියල් 506,258ක ප්‍රමාණයක් අධ්‍යයන කාර්යය මණ්ඩලවල පශ්චාත් උපාධි පර්යේෂණ සහ ශිෂ්‍යත්ව සඳහා ගෙවා තිබුණි. එසේ වුව ද එම ප්‍රමාණය අස්පෘශ්‍ය වත්කම් ලෙස ගිණුම්ගත කරනු වෙනුවට වෙනත් මෙහෙයුම් වියදම් ලෙස ගිණුම්ගත කර ඇත.

(ඊ) මූල්‍ය ප්‍රකාශනවලට අනුව ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ලැබිය යුතු පිළිවෙළින් රු. 9,751,892ක් සහ රු. 1,408,946ක් ලැබිය යුතු දෑ ලෙස පෙන්වා ඇත. කෙසේ වුවද මෙම ශේෂයන් ඉහත ආයතනවල මූල්‍ය ප්‍රකාශනවල විශ්වවිද්‍යාලයට ගෙවිය යුතු දෑ ලෙස සඳහන් නොවේ. එම නිසා මෙම ශේෂය නිවැරදි බව, යථාර්තවාදී බව සහ අය කළ හැකි බව යනාදිය විගණනයේ දී තහවුරු කර ගත නොහැකි විය.

(උ) පෙර වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල පෙන්වා ඇති රුපියල් 9,400,000ක් වටිනා මාර්ගස්ථ මුදල් රුපියල් 9,300,319ක් වටිනා විවිධ ණයගැතියෝ ලෙස වෙනස් කර ඇත. කෙසේ වුව ද පෙර වර්ෂවල ශේෂයන්ට කර ඇති ඉහත වෙනස්කම් පිළිබඳ කිසිම සාක්ෂියක් විගණනයට ඉදිරිපත් කර නැත.

(ඌ) විමසුමට භාජනය කරන වර්ෂය අවසානයේ ත්‍රිකුණාමලය මණ්ඩපයේ වාහන සහ තොරතුරු සංවර්ධන උපකරණවලට අදාළ ක්ෂය වෙන් කිරීම රු. 8,818,186කි. එසේ වුව ද මූල්‍ය ප්‍රකාශනවල මෙම අගය රු. 4,641,750 ලෙස පෙන්වා ඇත. මෙහි ප්‍රතිඵලයක් ලෙස වත්කම්වල අගය රු. 4,176,436න් මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් දක්වා ඇත.

(එ) පෙර වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල වටිනාකම රුපියල් 3,279,124,194ක් වූ වර්ෂ අවසාන ස්ථාවර වත්කම් ශේෂය වර්ෂයේ ගිණුම්වලට ආරම්භක ශේෂය ලෙස ගෙන ඇත්තේ රු. 3,273,604,684 ලෙසය. සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඒ තුළින් රුපියල් 5,519,510ක වෙනසක් පෙන්නුම් කෙරේ.

(ඒ) මූල්‍ය ප්‍රකාශනවලට අනුව සමාලෝචිත වර්ෂය අවසානයේ උපකුලපති අරමුදලේ ශේෂය රු. 2,194,647කි. උපලේඛනවලට අනුව එම අගය රු. 2,340,078ක් විය. මේ තුළින් රු. 145,431ක පැහැදිලි නොකළ වෙනස්කම් පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී. ලං. වි. ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

02-224

---

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - කුරුඳුවත්ත ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතියයි

කළුවා හේවගේ චතුරිකා තත්සරණි.

2019 ඔක්තෝබර් 31 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක දී පහත දැක්වෙන පරිදි විශේෂයෙන් හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී විසින් කළුවා හේවගේ චතුරිකා තත්සරණි වෙත ප්‍රදානය කරන ලද නිවාස ණය පහසුකම ගෙවීම සඳහා සුරක්ෂිතයක් වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි වාසියට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. ආර්. ෆායිස් විසින් ලියා සහතික කරන ලද අංක 2789 හා 2016.01.20 දින දරන උකස් බැඳුම්කරය මගින් මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති

දේපළ ණයකරු වශයෙන් කළුවා හේවගේ චතුරිකා තත්සරණි විසින් උකස්කර ඇති අතර, ඒ අනුව, 2019.09.17 වැනි දිනට (රු. 6,477,985.89) රුපියල් මිලියන හයයි හාර ලක්ෂ හැත්තෑ හත් දහස් නමසිය අසූ පහයි ශත අසූ නමයක මුදලක් ගෙවීම පැහැර හැර තිබේ.

ඒ අනුව ඉහත කී බැඳුම්කරය මත 2019.09.17 වැනි දිනට (රු. 6,477,985.89) රුපියල් මිලියන හයයි හාර ලක්ෂ හැත්තෑ හත් දහස් නමසිය අසූ පහයි ශත අසූ නමයක මුදලක් දැන් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති අතර, 2019.09.18 සිට විකුණුම් දිනය දක්වා තවදුරටත් පොළිය ද සමග අයවිය යුතු රු. 6,477,985.89 ක එකී මුදල සහ ප්‍රචාරණ පිරිවැය සහ මුදල් ලැබෙනතුරු දරන ලද අනෙකුත් ගාස්තු, ගෙවීම් (ඇත්නම්) අඩුකොට අයකරගැනීම සඳහා එකී අංක 2789 දරන බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස්කරන ලද සහ මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ, මුළු දිවයිනටම බලයලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙමගින් යෝජනා සම්මත කරගනී.

## උපලේඛනය

1. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ අධිකාරි පත්තුවේ, මහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ, මහර ප්‍රාදේශීය සභා සීමාවේ, 248 බී - කිරිබත්ගොඩ දකුණ ග්‍රාම නිලධාරි වසම තුළ, කිරිල්ලවල ගමේ පිහිටි "ගොන්නගහවත්ත සහ මිල්ලගහවත්ත (කොටසක්) නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එන්. සී. ඒ. ඉන්ද්‍රරත්න විසින් සාදන ලද අංක 251 හා 1992 නොවැම්බර් 14 දින දරන පිඹුරේ දැක්වෙන "ලොට් ඒ2" වශයෙන් ලකුණු කරන ලද බෙදාවෙන්කරන ලද ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : පී. ඩී. වාලිස් පෙරේරා සහ බී. කේ. හේරත් පෙරේරා විසින් හිමිකම්පාන ඉඩම් ද, නැගෙනහිරට : ඩබ්. ඒ. කරුණාරත්න විසින් හිමිකම්පාන ඉඩම ද, දකුණට : අංක 251/92 දරන පිඹුරේ ලොට් ඒ1 සහ ඒ3 සහ බස්නාහිරට : එම්. පී. ජුවානිස් පෙරේරා සහ තවත් අය හිමිකම්පාන ඉඩම ද මායිම් වූ පර්චස් විස්සක් (අ.0, රූ.0, පර්.20) විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි ඇතුළු සෑම සියලු දේද වේ. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 391/47 දරන හිමිකම යටතේ ලියාපදිංචි වී තිබේ.

   ඉහත කී ඉඩම පහත දැක්වෙන ඉඩම නැවත මැනීමකි.

   බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අධිකාරි පත්තුවේ, මහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ, මහර ප්‍රාදේශීය සභා සීමාවේ, 248 බී - කිරිබත්ගොඩ දකුණ ග්‍රාම නිලධාරි වසම තුළ කිරිල්ලවල ගමේ පිහිටි "ගොන්නගහවත්ත සහ මිල්ලගහවත්ත සහ කෝන්ගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. සමරවික්‍රම විසින් සාදන ලද අංක 28/2006 හා 2006 පෙබරවාරි 05 දින දරන පිඹුරේ දැක්වෙන "ලොට් එක්ස්" දරන බෙදාවෙන්කරන ලද ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : දැන් පී. ඩී. වාලිස් පෙරේරා සහ කේ. ඒ. හේරත් පෙරේරාගේ ඉඩම් ද, නැගෙනහිරට : කලින් ඩබ්. ඒ. කරුණාරත්නගේ සහ දැන් මහළු නිවාසයකට පරිත්‍යාග කරන ලද ඉඩම ද, දකුණට : අංක 251 දරන පිඹුරේ ලොට් ඒ1 සහ ඒ3 (අඩි 10ක් පළල පාර) සහ බස්නාහිරට : අංක 1552 දරන පිඹුරේ ලොට් 2, 3 සහ 4 ද මායිම් වූ පරචස් විස්සක් (අ.0, රූ.0, පර්.20) විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි ඇතුළු සෑම සියලු දේද වේ.

2. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අධිකාරි පත්තුවේ, මහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ, මහර ප්‍රාදේශීය සභා සීමාවේ, 248බී- කිරිබත්ගොඩ දකුණ ග්‍රාම නිලධාරි වසම තුළ, කිරිල්ලවල ගමේ පිහිටි "ගොන්නගහවත්ත සහ මිල්ලගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. එල්. පී. ෆ්‍රැන්සිස් පෙරේරා විසින් සාදන ලද අංක 1552 හා 1989 ඔක්තෝබර් 12 දින දරන පිඹුරේ දැක්වෙන "ලොට් 5" වශයෙන් ලකුණු කරන ලද බෙදාවෙන්කරන ලද ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : ලොට් 4 ද, නැගෙනහිරට : එම්. ටී. එමානෝනා විසින් හිමිකම්පාන ඉඩම (දැන් ආර්. එස්. එස්. ලයනල් මෙන්ඩිස් හිමිකම්පාන) ද, දකුණට : පාර සහ බස්නාහිරට : පාර ද මායිම් වූ පර්චස් තුනයි දශම දෙකයි බිංදුව (අ.0, රූ.0, පර්.3.20) විශාලත්වයෙන් යුත් ඉඩම වේ. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 391/48 දරන හිමිකම යටතේ ලියාපදිංචි වී තිබේ.

   ඉහත කී දේපළ පහත දැක්වෙන ඉඩම නැවත මැනීමකි.

   බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අධිකාරි පත්තුවේ, මහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ, මහර ප්‍රාදේශීය සභා සීමාවේ, 248 බී - කිරිබත්ගොඩ දකුණ ග්‍රාම නිලධාරි වසම තුළ, කිරිල්ලවල ගමේ පිහිටි "ගොන්ගහවත්ත සහ මිල්ලගහවත්ත සහ කෝන්ගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. සරමවික්‍රම විසින් සාදන ලද අංක 28/2006 හා 2006

පෙබරවාරි 05 දින දරන පිඹුරේ දැක්වෙන "ලොට් වයි" වශයෙන් ලකුණු කරන ලද බෙදාවෙන්කරන ලද ඉඩම් කොටසට මායිම් වශයෙන් උතුරට : අංක 1552 දරන පිඹුරේ ලොට් 4 ද, නැගෙනහිරට : අංක 251 දරන පිඹුරේ ලොට් ඒ3 (අඩි 10ක් පළල පාර) ද, දකුණට : අංක 251 දරන පිඹුරේ ලොට් ඒ3 සහ පාර (රම්මුතුගල සිට කුඹුරට) සහ බස්නාහිරට : අංක 251 දරන පිඹුරේ ලොට් 4 සහ පාර (රම්මුතුගල සිට කුඹුරට) ද මායිම් වූ පර්චස් දෙකයි දශම පහයි පහ (අ.0, රූ.0, පර්.2.55) විශාලත්වයෙන් යුත් ඉඩම වේ.

එකී අංක 2789 හා 2016.01.20 දින දරන උකස් බැඳුම්කරයේ දෙවන උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති, බලයලත් මිනින්දෝරු එන්. සී. ඒ. ඉන්ද්‍රරත්න විසින් සාදන ලද අංක 251 හා 1992.11.14 දින දරන පිඹුරේ ලොට් ඒ3 වශයෙන් ලකුණු කරන ලද මාර්ගය සඳහා වෙන්කිරීම මතින් සහ දිගේ මාර්ග අයිතිය ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කේ. ඒ. එල්. ටී. රණවීර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (නීති),
මාණ්ඩලික ලේකම්.

02-315

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.